# චුටි ගණන් කාරයින්ට



ලියන්සා එවින්දි බණ්ඩාර

# චුටි ගණන් කාරයින්ට


**ලියන්සා එවින්දි බණ්ඩාර**

**(කතෘ)**

**ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසල**

**3 වසර**


**2025-02-08**


**ISBN 978624208856-3**

# පිදුම

මාගේ පලමු ලේඛනයට මා ධෛර්යමත් කළ ආදරණීය අම්මාටත්, තාත්තාටත්, ලොකු අම්මාටත්, අක්කාටත්, නන් අයුරින් මා හට උපකාර කළ සියළු ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්, මාගේ යහළු යෙහෙළියන්ටත් ආදරයෙන් පිලිගන්වමි.

# පෙරවදන



සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඬන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පෙරවදන

මම ඉමහත් ප්‍රීතියෙන් ලියන මගේ මෙම පෙරවදන ග්‍රීන්හිල් ජාත්‍යන්තර පාසලේ තරුණ ලේඛකයින්ගේ නිර්මාණශීලිත්වය, වෙහෙස මහන්සි වී වැඩ කිරීම සහ කැපවීම ඉස්මතු කරයි. අපගේම තරුණ කතුවරුන්ගේ ලේඛන සහිත පොතක් ප්‍රකාශයට පත් කිරීමේ අපගේ උත්සාහය මෙය වන අතර, ග්‍රීන්හිල් හි සියලු දෙනාට ලබා දී ඇති කාර්යයේ ජයග්‍රහණ පිළිබඳව මා කෙතරම් ආඩම්බර වනවාද යන්න ප්‍රකාශ කිරීමට මට අවසර දෙන අතර ව්‍යාපෘතියට සහාය වූ ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ උපදේශකයින්ට මගේ කෘතඥතාව පළ කරයි. හෙට දවසේ සහ ජාතියේ මෙම අංකුර නායකයින්ගේ අනාගතය හැඩගැස්වීමේදී කතන්දර කීමේ, ස්වයං ප්‍රකාශනයේ සහ වචනවල බලයේ වැදගත්කම ද අවධාරණය කරමි. අවසාන වශයෙන්, සිසුන්ගේ කටහඬ අගය කිරීමට සහ සැමරීමට පාඨකයින් දිරිමත් කරන අතරම ඔවුන්ගේ අදහස් දිගටම ලිවීමට සහ බෙදා ගැනීමට ඔවුන්ව පොළඹවයි.

අපගේ සිහිනය සැබෑ කර ගැනීම සඳහා ලබාදුන් මගපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් අපගේ පුස්තකාලයාධිපති හංසිකා රණවීර මහත්මියට සහ ප්‍රවීන ලේඛක සෙනෙවිරත්න මහාලේකම් මහතාට විශේෂ ස්තුතිය පුදකර සිටිමු.

"යුතුකම පළමු සතුට ඊළඟට"

ආචාර්ය ලලිත් නවරත්න,
විදුහල්පති,

# චූටි ගණන් කාරයින්ට

අද සෙනසුරාදා. නිවාඩු දවසක්. සමත්, රිසිත්, නයනා, සහ සිගිති සෙල්ලම් ගෙදරක් දමන්න සිතුවා. අපි අඹ ගස යට ගණිත පන්තියක් දමමු. ඒක නම් හොඳ අදහසක්! "නයනා අපේ ගුරුතුමිය වෙන්න". අනිත් අය කෑගැසුවා. ආයුබෝවන් ළමයිනේ, ආයුබෝවන් ගුරුතුමිය. අපි පාඩම පටන් ගනිමු.



"අපි තරඟයක් තියමුද"? ගුරුතුමිය ඇසුවා. "අපි එකතු කිරීමේ ගනන් හදමු" නයනා කීවා. මම ගණන කියන්නම් ඔයාලා උත්තර දෙන්න. එහෙනම් අහගන්න.



මට පැන්සල් 8 ක් තිබුණා. මට තව 3 ක් අම්මා දුන්නා. දැන් මා ළඟ කීයක් තිබේද? "මම උත්තරේ කියන්නම්" සමත් කීවා. හා හොඳයි.




අටට තුනක් (8+3) එකතු කරාම එකොළහයිනේ, හැමෝම අත්පොළසන් දුන්නා. බොහොම හොඳයි සමත්.

දැන් රිසිත් ගානක් කියන්න. හා හොඳයි ගුරුතුමී.

එහෙනම් අහගන්න.





**මට රෝස 5 ක් තිබුනා, අම්මා ඩේලියා 5 ක් දුන්නා. දැන් ඔක්කොම මල් කීයද?. සිගිති අත ඉස්සුවා. හා හොඳයි, සිගිති කියන්න බලන්න උත්තරේ.**




පහට තව පහක් (5+5) එකතු කරාම උත්තරේ වන්නේ දහයයි. ආයෙත් හැමෝම අත්පොඩි ගැසුවා. බොහොම හොඳයි.

**ළමයිනේ, දැන් මම ඔයාලට ගනන් 5 ක් දෙනවා. ඔයාලා අනිත් දවසේ කරගෙන එන්න.**



**ආයුබෝවන් ළමයිනේ, ආයුබෝවන් ගුරුතුමිය.**

**දැන් අපි ගෙදර යමු.**



**නිමි.**



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්